# අනුරාධපුර කෞතුකාගාරයන්හි දක්නට ලැබෙන පුරාණ කාසි ඔස්සේ හෙළිවන සන්නිවේදනය පිළිබඳ අධ්‍යයනයක් (අභයගිරිය හා ජේතවනය කෞතුකාගාර ඇසුරිනි)

ඩබ්.එච්.සී.එන්.රාජිනී දයාසිරි*

පුරාවිද්‍යා විෂයය ධාරාව තුළින් සිදු කෙරෙනු ලබන මානව යටගියාව හැදෑරීම තුළ අතීත සමාජ ප්‍රපංචයන් හඳුනා ගැනීමෙහිලා පුරාවිද්‍යාවේ අනු විෂයයක්වන නාණක විද්‍යාවද ඉතා වැදගත් වේ. පුරාවිද්‍යාවේදී ද්‍රව්‍යාත්මක සාධක වශයෙන් විවිධ වූ සංකේතයන් නිරූපණය කරමින් නිෂ්පාදනය කරන ලද මෙම කාසි මානව සමාජයේ අත්‍යාවශ්‍යම සාධකයක් බවට පත් විය. සමාජය තුළ ස්ථර භේදයකින් තොරව සංසරණය වීමත් සමඟ තත්කාලීන සමාජයේ පැවති යම් යම් ලක්ෂණ කාසි තුළින් විද්‍යමාන වන්නට විය. ශ්‍රී ලංකාවේ පාලනයන් පැවති විවිධ යුගයන්හි දී නිෂ්පාදනය කරන ලද පුරාණ දේශීය හා විදේශීය කාසි පිළිබඳව විමර්ශනය කිරීම මෙම අධ්‍යයනයේ මූලික අරමුණ විය.එනම් පුරාණ කාසි යනු අතීතයේදී ශ්‍රී ලංකාවේ පැවති දේශපාලනික, ආර්ථික, ආගමික, සමාජීය හා සංස්කෘතික සංදර්භයන් පිළිබඳව තොරතුරු බොහොමයක් හෙළිදරව් කරගත හැකි වැදගත් සාධකයකි.මෙම සංදර්භයන් හේතු කරගෙන කාසිවල සංකේත නිරූපණය සිදුව ඇත.

පුරාණ කාසි ඔස්සේ හෙළිවන සන්නිවේදනය යන මාතෘකාව අධ්‍යයනය කිරීම සඳහා යොදාගනු ලැබූවේ අනුරාධපුර කෞතුකාගාරයන්හි දක්නට ලැබෙන පුරාණ දේශීය හා විදේශීය කාසීන්ය. අනුරාධපුරයේ අභයගිරිය හා ජේතවනය යන කෞතුකාගාරයන්හි ඇති සියලුම දේශීය හා විදේශීය කාසි මෙහිදී අධ්‍යයනය කරනු ලැබේ.විශේෂයෙන්ම මෙම කෞතුකාගාරයන් දෙකෙහිම එක හා සමාන වර්ගවලින් යුක්ත කාසි තිබෙනු අතර ජේතවනාරාම කෞතුකාගාරයේ බහුල වශයෙන්ම විදේශීය කාසි දක්නට ලැබේ.විවිධ යුගයන්හිදී පැවති දේශපාලන තත්වය රාජ්‍ය පාලකයින්ගේ බල ආධිපත්‍යය පංති භේදයකින් තොරව සමාජයේ විවිධ තරාතිරම් තත්වයන් විශේෂයෙන්ම අනුරාධපුරය වැනි යුගවලදී රාජ්‍ය ආගම වූ බුදු දහම ලංකාවේ ව්‍යාප්ත වීමට පෙර පැවති ආගම් හා අභිචාර විධි පිළිබඳවද දකුණු ඉන්දීය ආක්‍රමණ හේතුවෙන් බුදු දහමට හිංදු දහමෙන් ඇති වූ බලපෑම පිළිබඳවද එකල මුල්බැස ගත් දේව විශ්වාස පිළිබඳවද එකල සමාජයේ පැවති මූල්‍යමය අගයයන් නිරූපණයද යුගයෙන් යුගයට දියුණු වූ අක්ෂර කලාවේ ස්වභාවයද සමාජයේ සෞභාග්‍යය හඟවන අංගයන්ද යනාදී සියලුම කරුණු පිළිබඳව කාසිවල නිරූපිත සංකේතයන් මඟින් අධ්‍යයනයට ලක් කරනු ලැබේ.

ප්‍රමුඛ පද - කාසි, කෞතුකාගාර, පුරාණ, සංකේත, සන්නිවේදනය

* පුරාවිද්‍යා අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය